F35

# පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය පිළිබඳව සිසුන් දරන ආකල්ප හා ඔවුන්ගේ අධ්‍යාපන සාධනය අතර සම්බන්ධතාව:- සමීක්ෂණයක් (ගම්පහ දිස්ත්‍රික්කයේ අ.පො.ස. උසස් පෙළ සිසුන් ඇසුරෙනි)


ඩබ්ලිව් ඒ චාලට්

(පිටිගම අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම)


සිසුන් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දරන ආකල්ප ඔවුන්ගේ සාධනය කෙරෙහි කෙබඳු බලපෑමක් කරන්නේ දැයි සොයා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. ඊට අමතරව ස්ත්‍රී පුරුෂ භාවය අනුව, විවිධ පාඨමාලා අනුව, පාසැල් වර්ග අනුව හා සමාජ පන්තිය අනුව සිසුන්ගේ ආකල්ප හා සාධනය අතරපවතින සම්බන්ධතාවද සමීක්ෂණයට භාජනය විය.

1ඒ ( නේවාසිකාගාර පහසුකම් ඇති හා උසස් පෙළ විද්‍යා වාණිජ කලා පන්ති ඇති) 1බී ( නේවාසිකාගාර පහසුකම් නැති හා උසස් පෙළ විද්‍යා වාණිජ කලා පන්ති ඇති" ) 1සී ( උසස් පෙළ වාණිජ හා කලා පන්ති පමණක් ඇති) වර්ග වලට අයත් පාසැල් හා පෞද්ගලික පාසැල් වලින්, කලා වාණිජ හා විද්‍යා පාඨමාලා වලට අයත් සිසුන් 550 ක් අධ්‍යාපනයේ නියැදිය වශයෙන් තෝරා ගැනි.

ලයිකර්ට් පරිමාණයට අනුව සැකසූ ආකල්ප පරීක්‍ෂණ 3ක් මගින් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය පිළිබඳ තොරතුරුද, ප්‍රශ්නාවලියක් මගින් සිසුන්ගේ සාමාන්‍ය තොරතුරුද ගණනය කෙරිණි. අ.පො.ස. උසස් පෙල විභාගයේ විෂයයන් 4ක් සඳහා ලබා ගත් සංකේත, දත්ත බවට පරිවර්තනය කිරීමෙන් සාධනය මැනීම සිදුවිය. ආකල්පය පරීක්ෂණ වලින් ලබාගත් ලකුණු වල මධ්‍යනයය හා සම්මත අපගමනයක්, උසස් පෙල විභාගයෙන් ලබාගත් සාධන ලකුණුවල මධ්‍යනයය හා සම්මත අපගමනයත් භාවිත කොට (අපතිකතා වගු ඇසුරෙන්) කයිවර්ග පරීක්‍ෂණයක් මගින් අභ්‍යුපගමයාස පිරික්සිනි. සාමාන්‍ය තොරතුරු සඳහා ප්‍රතිශත භාවිතා විණි.

සමීක්ෂණයෙන් හෙළිවූ නිගමන අතරින් පහත දැක්වෙන ඒවා ප්‍රධාන තැනක් ගනී. සිසුන් පාසැල කෙරෙහි දක්වන ආකල්ප හා ඔවුන්ගේ සාධනය අතර සම්බන්ධතාවක් දක්නට නැතත්, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි දක්වන ආකල්ප හා සාධනය අතර සම්බන්ධතාවක් පවතී. එහෙත් පාසැල, ගුරුවරයා හා අධ්‍යාපනය කෙරෙහි ධන ආකල්ප ඇරීම ධන සාධනය කෙරෙහිත්, ඍණ ආකල්ප ඇරීම ඍන සාධනය කෙරෙහිත් පැහැදිලිවම බලපාන්නේ යැයි නිගමනය කළ නොහැකිය.

පිරිමි ළමයින් පහල හා පහල මධ්‍යම සාමාජ පන්ති සිසුන්, කලා හා වානිජ සිසුන්, ।ඒ ।බී හා ।සී පාසැල් සිසුන් පාසැල කෙරෙහි දක්වන ආකල්ප හා සාධනය අතර සම්බන්ධතාවක් පවතී. ගැහැනු ළමයින්, ඉහල හා පහල මධ්‍යම සාමාජ පන්ති සිසුන්, විද්‍යා සිසුන්, හා පෞද්ගලික සිසුන් කෙරෙහි එවැනි සම්බන්ධතාවක් නැත. පහළ මධ්‍යම හා පහළ සාමාජ පන්ති සිසුන්, ।ඒ ।බී පාසැල් සිසුන්, ගැහැණු ළමයින්, පිරිමි ළමයින් කලා, වානිජ, හා විද්‍යා සිසුන්, ගුරුවරයා කෙරෙහි දක්වන ආකල්ප හා සාධනය අතර සම්බන්ධතාවක් පවතී. ඉහළ හා ඉහළ මධ්‍යම සාමාජ පන්ති සිසුන්, පෞද්ගලික හා । සී පාසැල් සිසුන් ගුරුවරයා කෙරෙහි දරණ ආකල්ප හා ඔවුන්ගේ අධ්‍යාපනය සාධනය අතර සම්බන්ධතාවක් නැත.

ගැහැණු ළමයින්, පහළ හා පහළ මධ්‍යම සමාජ පන්ති සිසුන්, කලා සිසුන්, ।ඒ ।බී හා ।සී පාසැල් සිසුන් අධ්‍යාපනය කෙරෙහි දරණ ආකල්ප හා අධ්‍යාපන සාධනය අතර සම්බන්ධතාවක් පවතී. එහෙත් පිරිමි ළමයින්, ඉහළ හා ඉහළ මධ්‍යම සමාජ පන්ති සිසුන්, විද්‍යා හා වාණිජ පාඨමාලා වලට අයත් සිසුන්, හා පෞද්ගලික පාසැල් සිසුන් අධ්‍යාපනය කෙරෙහි දරණ ආකල්ප හා අධ්‍යාපන සාධනය අතර සම්බන්ධතාවක නැත.